**2021 මැයි මස 21 වන දින පැවති**

**තිස් හත් වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2021.05.21**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

01. ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
02. ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
03. ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
04. ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
05. ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
06. ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
07. ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
08. ගරු මන්ත්‍රී එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
09. ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
10. ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ( එ.ජා.ප)
11. ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය ( එ.ජා.ප)
12. ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා ( ජ.වි.පෙ)
13. ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා ( ජ.වි.පෙ)
14. ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ( ශ්‍රී.ල නි.ප)
15. ගරු මන්ත්‍රී වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා (ස්වාධීන කණ්ඩායම)

**දන්වා සහභාගී නොවූ:-**

16. ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
17. ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
18. ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා ( එ.ජා.ප)
19. ගරු මන්ත්‍රී ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය ( එ.ජා.ප)
20. ගරු මන්ත්‍රී ජී.ඒ නෙළුම් මැතිනිය ( එ.ජා.ප)
21. ගරු මන්ත්‍රී පී කරුණාරත්න මැතිතුමා ( ශ්‍රී.ල නි.ප)

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින් ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් සභාවේ ලේකම්වරයා විශේෂ online රැස්වීමක් සඳහා සහභාගී වී ඇති බැවින් එම රාජකාරි ආවරණය කිරීම සඳහා තාවකාලික ලේකම්වරයෙකු පත් කර ගන්නා ලෙස ඉල්ලා සිටින ලද අතර අද වන විට පවතින අයහපත් සෞඛ්‍ය තත්වය හමුවේ රැස්වීමේ රාජකාරි සිදු කිරීමේ හැකියාව සුදුසු නොවූවත්, මහ සභාව පැවැත්වීම අත්‍යාවශ්‍ය වන බැවින් අද දින රැස් වූ බැවින් හැකි ඉක්මනින් අදාල රැස්වීම් කටයුතු අවසන් කර විසිර යාම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා අද දින මහ සභාවේ ලේකම්වරයා සභා ගර්භයට පැමිණෙන තුරු ලේකම් ධූරයේ රාජකාරි ආවරණය කිරීම සඳහා කළමණාකරණ සහකාර සේවා නිළධාරි අයි.ජී.සී.නයෝමි වීරකෝන් මහත්මිය පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u> එම යෝජනාව ස්ථිර කරන ලද අතර ඒ අනුව 2021.05.21 වන දින මහ සභාවේ රාජකාරී ආවරණය කිරීම සඳහා සභා නිළධාරීනිය තේරී පත් විය.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**<u>2021.04.27 මහ සභා කෙටුම්පත් වාර්ථාව</u>**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021.04.27 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2021.04.27 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> 2021.04.27 දින පැවති කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>සංශෝදන</u>**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 36 වන පිටුවේ නෙළුබැව ශ්‍රී පද්මගිරි පුරාණ රජමහ විහාරයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ පරලෝසැපත් වී ඇති බවත්, ලෙසට කර ඇති ප්‍රකාශය නෙළුබැව ශ්‍රී පද්මගිරි පුරාණ රජමහ විහාරයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ අපවත් වී ඇති බවත් ලෙසට සංශෝධනය විය යුතු බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා</u> 24 වන පිටුවේ 5 වන පරිච්ඡේදයේ අනාගතය සම්බන්ධයෙන් ප්‍රාදේශීය ව්‍යාපාරිකයන් හා කෝප් සිටියේ ව්‍යාපාරිකයන් අතර පවතින වෙනස හා එහි ක්‍රියාත්මක ව්‍යාපෘති තුලින් ඔවුන්ට සාපේක්ෂව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ව්‍යාපාරිකයන්ට වන අලාබය සම්බන්ධයෙන් අදහස් දැක්වීම ගෝෂාකාරී තත්වය හමුවේ පැහැදිලි නොවූ ලෙස සටහන් කර ඇතත්, එය සංශෝධනය කර සටහන් කිරීමට කටයුතු කරන ලෙසත්, බොහෝ අවස්ථා වලදී තමන් විසින් සිදු කරන ප්‍රකාශ නියම අර්ථයක් රහිතව සටහන් වීම අඛණ්ඩව සිදු වන බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2021.04.27 වන දින පැවති මහ සභා කෙටුම්පත් වාර්ථාව ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

**01. නිවාඩු දැනුම් දීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා, ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය, ගරු මන්ත්‍රී ජී.ඒ නෙළුම් මැතිනිය,ගරු මන්ත්‍රී පී කරුණාරත්න මැතිතුමා මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් ලිපි මහ සභාවට නිවේදනය කරන ලදී.

**ඇ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**නැත.**

**ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**නැත.**

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. නැගෙනහිර නුවරගම් පළාත් ප්‍රාදේශීය සභාවට අයත්, ව්‍යාපාර ස්ථාන දීර්ඝ කාලීන බදු පදනම මත දැනට ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරිකයන් වෙතම ලබා දිම.සඳහා වූ කල් තැබීමේ යෝජනාව**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> නැගෙනහිර නුවරගම් පලාත ප්‍රාදේශීය සභාවට අයත් ව්‍යාපාර ස්ථාන දීර්ඝ කාලීන බදු පදනම මත දැනට ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරිකයන් වෙතම ලබා දීමට සුදුසු බවට 2021.04.27 වන දින පැවති මහ සභාවේදී කල් තැබූ යෝජනාවේ ගිවිසුම් කොන්දේසි ඇතුලත් කරන ලෙසට කරනු ලැබූ ඉල්ලීමට අනුව සකස් කල ගිවිසුම ගරු මන්ත්‍රි තුමන්ලා වෙත යොමු කර තිබෙන බැවින් එම ගිවිසුම සම්බන්ධව අදහස් දැක්වීම සිදු කර කල් තැබූ යෝජනාව අද දින සාකච්ඡාවට භාජනය කර සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> රාජ්‍ය ආයතනයක් ලෙස බල ප්‍රදේශයේ ව්‍යාපාරිකයන් ආයතනය සමඟ විශාල විශ්වාසයකින් ගිවිසුම් ගතවී තිබෙන බැවින් සාමාන්‍ය මහ ජනතාව කිසි ලෙසකින්වත් සභාව වැරදි සිදු කරනු ලබන බවට හිතන්නේ නැති බවත්, එසේ තිබියදී සාමාන්‍ය ගිවිසුම් නීතිය අනුව කොන්දේසි කඩ වුනොත් හැර කිසිම අයුරකින් මහ සභාව මගින් ගිවිසුම අළුත් කිරීමේ අයිතියක් නොමැති බවත්, ගරු සභාපතිතුමා බල ප්‍රදේශයේ සමස්ත කඩ කාමර සඳහා කරනු ලබන මෙම යෝජනාව තුල දැනට ගිවිසුම් ගත නොවූ හෝ කොන්දේසි කඩ කර සභාවට පවරා ගෙන ඇති කඩ පමණක් ක්‍රියාත්මක කල හැකි බවත්, ඉතිරි කඩ සඳහා එහි කල්පිරෙන දින සඳහන් කර නොමැතිනම්, කිසිසේත්ම අදාල කර ගත නොහැකි බව සඳහන් කරන ලදී.

තවද මේ සඳහා නීතිමය උපදෙස් ලබා ගැනීම ගරු සභාපතිතුමාගේ වගකීමක් වන බවත්, සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා</u> මෙම ගිවිසුම් ගත වීම තුල සිදු වී ඇති වරදක් නිවැරදි කිරීමකට යන බවක්, පිළිබිඹු වන බවත්, මේ තුලින් නීත්‍යානුකූල භූමියේ අයිතිය නැතැයි යන උපකල්පනයේ සිට ගිවිසුම් ගත නොවී සිටිනවාද එසේ නොමැතිනම් ප්‍රාදේශීය සභාවට අයිති නැතත්, එහි නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීම සඳහා මෙම ගිවිසුම අත්සන් කරනවාද යන්න පැහැදිලිව වටහා ගත යුතු බවත්, මෙම ගිවිසුම වසරින් වසර අළුත් කිරීමේදී එහි දැනට සිටින අයිතිකරුවන් වෙතින් වෙනත් පාර්ශවයකට යාවී යන්න බියක් ඇති වේවි යන්නත්, දැනට බදු කරුවන්ව සිටින පුද්ගලයන්ට අසාධාරණයක් නොවන පරිදී කටයුතු කල යුතු සේම ඇතැම් කඩ කාමර නිවාස ලෙස භාවිතය නැවැත්වීම වෙනුවෙන් වූ කරුණු ගිවිසුම තුල ඇතුලත් විය යුතුය යන්නත්, කරුණු දක්වන ලද අතර පවතින තත්වය අනුව ස්ථානීය වශයෙන් ඇතැම් කොන්දේසි ඇතුලත් කල යුතු වන බවත්, මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූලමය උපදෙස් ලබා ගත යුතු බව සඳහන් කරන ලදී.

තවද ගිවිසුම තුල අන්තර්ගත වන කරුණු ගිවිසුම කඩවන ඕනෑම අවස්ථාවක නීතිමය පියවර ගත යුතු බවත්, සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා කඩ කාමර වල භූමියේ අයිතිය සභාව සතුව නොපවතින බැවින් නීත්‍යානුකූල ගැටළු පැන නගින බැවින් සුළු කාලයක් හෝ ගත කර භූමියේ අයිතිය ප්‍රාදේශීය සභාව සතු කර ගත යුතු බව සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මේ සඳහා නීත්‍යානුකූල පියවර ගැනීමට කටයුතු කර තිබෙන බවත්, එසේවත් නීත්‍යානුකූල කටයුතු සිදු කල නොහැකි ස්ථාන පවතින බවත්. මෙවැනි ගිවිසුම් ගත වීමක් හෝ සිදු කර අයිතිය පවත්වාගෙන යාමට කටයුතු කරන බවත්, එසේ අයිතිය තහවුරු කල හැකි භූමින් මැනුම් කිරීමට ඉදිරියේදී අදහස් කරගෙන සිටින බවත්, ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා තමන් දිගින් දිගටම බල ප්‍රදේශයේ කඩ කාමර අඳුරු යුගයකට යාමට හේතුව ව්‍යාපාරික ස්ථාන ලෙස නොපැවතීම හා ව්‍යාපාර කටයුතු සිදු නොකිරීමත්. යන කරුණු මත බැවින් ව්‍යාපාර ස්ථාන කිසිසේත්ම නේවාසික භාවිතයන් සඳහා යොදා නොගැනීම වෙනුවෙන් වූ කොන්දේසියක් අනිවාර්යෙන්ම ගිවිසුම තුල අන්තර්ගත කොට එය පාලනය යටතට ගෙන ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මෙම ගිවිසුම අනිවාර්යෙන්ම ව්‍යාපාරිකයන් සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ එකඟතාවය සහිතව ගිවිසුම්ගත වීම සුදුසු බවත්, සභාවේ එකඟතාවය මත පමණක් ගිවිසුම් ගතවීමකට නොයා යුතු බවත්, ඒකමතිකව සහා සම්මත වූ ගිවිසුමක් නීතිඥ උපදෙස් සඳහා ඉදිරිපත් කල යුතු වන බවත්, ගිවිසුම් ගත වීමේදී පුද්ගල වාසි තකා ගිවිසුම් ගත වීම සුදුසු නොවන සේම මෙම සියළු කඩ කාමර මීට ඉහතදී දේශපාලන හිතවත්කම් මත බෙදා දුන් බවත්, 1997 මැතිවරණයට පෙර එ.ජා.ප ආණ්ඩුව විසින් 7 ඇල සකස් කරනු ලැබූ කඩ කාමර ආණ්ඩුව වෙනස් වීමත් සමඟ බලහත්කාරයෙන් අත්පත් කර ගත් බවත්. අනතුරුව ඒ සඳහා ගිවිසුම් ගත වීමට සභාවට සිදු වූ බවත්, සෑම කඩ කාමරයක්ම පාහේ මේ වන විට අතුරු බදු ලබා දී තිබෙන බවත්, සඳහන් කරන ලදී.

තවද මෙම කඩ කාමර විධිමත් වී දියුණු වීමට නම් යම් තක්සේරු මුදලක් වාරික වශයෙන් අය කර අවම වශයෙන් වසර 30 ක් වත් ගෙවුණු පසු සභාවටද ආදායමක් ලබා ගනිමින් ව්‍යාපාරිකයන් වෙතම අයිතිය හිමි වන ක්‍රමවේදයක් සකස් කල යුතු වන බවත්, එහි සාර්තකත්වය මීට වඩා ඉහල බවත්, සඳහන් කරන ලද අතර එමගින් ව්‍යාපාරිකයන් ට ණය පහසුකම් ලබා ගැනීමට හා දියුණු කිරීමට හැකියාව හිමි වන බවත්, සඳහන් කරන ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා 22 වන කොන්දේසිය යටතේ පිළිබිඹු වන අදහස තර්කානුකූල නොවන බවත්, අළුත්වැඩියාවක් ඉල්ලුම් කරන අවස්ථාවක එය ඉටු කර දීමට කටයුතු කරන බවට සඳහන් ප්‍රකාශයද පැහැදිලි විය යුතු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා සිදු කල අදහස් දැක්වීම අනුව වසර 30 ක් ඉක්ම ගිය පසු අයිතිය හිම වීමට සැළැස්වීමේදී අවසන් වරට සභාවට ඉතිරි වන්නේ මොනවාද යන්නත්, එය සුදුසු නොවන ක්‍රියාමාර්ගයක් වන බවත් සඳහන් කරන ලද අතර අළුත්වැඩියාවන් සිදු කර දෙනු ලබන්නේ නම් ඒ සඳහා නිශ්චිතව මුදලක් සඳහන් කර තිබිය යුතු බවත්. සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා 10 වන වගන්තිය තුල ස්වාභාවික විපත් සඳහා දෙවන පාර්ශවය විසින් වගකීම දරා ගත යුතු බවට සඳහන් වුවත්, ස්වාභාවික විපත් සඳහා ප්‍රාදේශීය සභාව වන්දි ලබා දිය යුතු බවත්, 8 වන වගන්තිය හා 22 වන වගන්තිය අතර ගැටීමක් පවතින බවට පිළිබිඹු වන බවත්, මෙවැනි නීතිමය ගැටළු පවතින ගිවිසුමක් සම්බන්ධයෙන් නීතිඥ උපදෙස් ලබා ගත යුතු බැවින් එසේ සිදු නොකරන්නේ නම් මෙම යෝජනාව සඳහා තමන් විරුද්ධ වන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා ගිවිසුම නිවැරදිව අධ්‍යනය කලා නම් අප සිදු කරන්න යන කරුණු ඉතා හොඳින් පැහැදිලි වන බවත්, දැනට සිටින ව්‍යාපාරිකයන් වෙත මෙම කඩ කාමර අහිමි වේය යන බිය සඳහා 5 වන වගන්තිය තුලින් පිළිතුර හිමි වන බවත්, 8 වන වගන්තිය තුල කඩ හිමියාගේ අවශ්‍යතාවය මත ඔහු ලබා ගත යුතු පහසුකම් වන බවත්, 22 වන වගන්තිය තුලින් පොදු පරිශ්‍රයේ පහසුකම් පිළිබඳ ඇතුලත් වන බවත්, 10 වන වගන්තිය තුලින් කඩ කාමර ව්‍යාපාර කටයුතු වලින් තොර වීම වලකාලීමට කරුණු ඇතුලත් වන බවත් සඳහන් කරන ලදී.

ලේකම් තුමා සභා ගර්භයට පැමිණ අසුන් ගන්නා ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව තුල දැක්වූ අදහස් සැළකිල්ලට ගැනීමේදී බදු දීමට අදාල ගිවිසුම සභා ගත කරන ලෙසට කල ඉල්ලීම ගෞරවයෙන් යුතුව සළකා බලා ගිවිසුම් පත්‍රය අධ්‍යනය කිරීම සඳහා යොමු කර අද දින සාකච්ඡාව සඳහා භාජනය කල බවත්, එහිදි ඉදිරිපත් කල කරුණු අනුව නීතිමය උපදෙස් ලබා ගැනීම සඳහා අදහස් යොමු වූ බැවින් දැනට ඉදිරිපත් කල ගිවිසුම් කොන්දේසි සඳහා නීතිමය උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බවත්, මෙම කඩ කාමර ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පරිභාහිරව රජයේ තක්සේරු වටිනාකම අනුව වසරින් වසර ගිවිසුම් ගත වී දැනට ව්‍යාපාර කරගෙන යන ව්‍යාපාරිකයන් වෙත දීර්ඝ කාලීනව බදු දීමේ යෝජනාව සභා සම්මත කර ගැනීම සුදුසු බව ප්‍රකාශ කරමින් ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් විරෝධතා පවතින්නේද යන්න විමසන ලදී.

එහිදි නැගී සිටි ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා මෙම ගිවිසුම නීත්‍යානුකූල නොවන නිසා හා ගිවිසුම් කොන්දේසි එකිනෙක ගැටෙන නිසා තමන් මෙම යෝජනාවට විරුද්ධ වන බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා විරෝධතා ඉදිරිපත් කිරීම හේතු කොටගෙන ලේකම්වරයා වෙත ඡන්දය විමසීමට කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ලේකම් වරයා විසින් ඡන්දය විමසූ අතර යෝජනාවට පක්ෂව ඡන්ද 10 ක්ද විපක්ෂව ඡන්ද 03 ක්ද හිමි වූ අතර ඡන්දය විමසන අවස්ථාවේදී දෙදෙනෙකු සභා ගර්භයෙන් පිටව යන ලදී.

| | | |
|---|---|---|
| **1. ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා** | | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)- පක්ෂයි** |
| **2.ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා** | | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **3.ගරු මන්ත්‍රී** | **කේ.ඒ ශාන්ත මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **4. ගරු මන්ත්‍රී** | **බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **5.ගරු මන්ත්‍රී** | **කේ.ඒ සංජීව මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **6.ගරු මන්ත්‍රී** | **ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **5.ගරු මන්ත්‍රී** | **ජේ.ඒ ජයවර්ධන මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **6.ගරු මන්ත්‍රී** | **එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **7.ගරු මන්ත්‍රී** | **පී.ටී සිරිසේන මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **8.ගරු මන්ත්‍රී** | **ආර්.එම් කුමාරසිංහ මැතිතුමා** | **( එ.ජා.ප) - විපක්ෂයි** |
| **9.ගරු මන්ත්‍රී** | **ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය** | **( එ.ජා.ප) - විපක්ෂයි** |
| **10.ගරු මන්ත්‍රී** | **එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා** | **( ජ.වි.පෙ)- සභා ගර්භයෙන් පිටව යන ලදී** |
| **11.ගරු මන්ත්‍රී** | **කේ. හැරිසෙන්ස් මැතිතුමා** | **( ජ.වි.පෙ) - සභා ගර්භයෙන් පිටව යන ලදී** |
| **12.ගරු මන්ත්‍රී** | **ඩී.පී බන්දුලසේන මැතිතුමා** | **( ශ්‍රී.ල නි.ප) - විපක්ෂයි** |
| **13.ගරු මන්ත්‍රී** | **වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා** | **(ස්වාධීන කණ්ඩායම) - පක්ෂයි** |

**12. මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021.05.07 වන දින පැවති මුදල් කමිටුව මගින් ලබා ගත් පහත සඳහන් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**I. ප්‍රාදේශීය සභා කාර්යාලයේ සේවය කරනු ලබන ආදායම් පරීක්ෂක නිළධාරීන් දෙදෙනා වෙත නිල ඇඳුම් ලබා දීම.**

ප්‍රාදේශීය සභා කාර්යාලයේ සේවය කරනු ලබන ආදායම් පරීක්ෂක මහත්මින් දෙපල වෙත නිල ඇඳුම් කට්ටල 03 ක් ලබා දීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 10, මාර්කට් පෙදෙස, ධර්මපාල මාවත, අනුරාධපුර ලිපිනයේ පිහිටි තරිඳු එන්ටර්ප්‍රයිසස් වෙතින් ආදායම් පරීක්ෂක මහත්මින් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය එවා ඇති චක්‍රලේකය ප්‍රකාරව උපරිමය රු 14,000 කට සීමා කරමින් මිල දී ගැනීමට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**II. ප්‍රාදේශීය සභා කාර්යාලයේ සේවය කරනු ලබන තාක්ෂණ නිළධාරීන් දෙදෙනා වෙත නිල ඇඳුම් ලබා දීම.**

ප්‍රාදේශීය සභා කාර්යාලයේ සේවය කරනු ලබන තාක්ෂණ නිළධාරී දෙපල වෙත නිල ඇඳුම් කට්ටල 03 ක් ලබා දීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 10, මාර්කට් පෙදෙස, ධර්මපාල මාවත, අනුරාධපුර ලිපිනයේ පිහිටි තරිඳු එන්ටර්ප්‍රයිසස් වෙතින් තාක්ෂණ නිළධාරීන්ගේ නිල ඇඳුම් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය එවා ඇති චක්‍රලේකය ප්‍රකාරව උපරිමය රු 14,000 කට සීමා කරමින් මිල දී ගැනීමට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**III. ප්‍රාදේශීය සභාවේ දෛනික කාර්යයන් සඳහා අවශ්‍ය ජල ටැංකි මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභාවේ දෛනික කාර්යයන් සඳහා අවශ්‍ය ජල ටැංකි මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර 500L ධාරිතාවයෙන් යුතු ප්ලාස්ටික් ජල ටැංකි වෙනුවෙන් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 90, මහ වීදිය, අනුරාධපුර ලිපිනයේ පිහිටි මහජන හාඩ්වෙයාර් වෙතින් සම්පූර්ණ වටිනාකම රු 21,400 කට 500L ධාරිතාවයෙන් යුතු ප්ලාස්ටික් ජල ටැංකි මිල දී ගැනීම සඳහා මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**IV. 280 තරියන්කුලම පොදු සුසාන භූමියේ ඉදි කරනු ලබන සොහෙන් ගෙය සඳහා අවශ්‍ය ඇස්බැස්ටෝ ශීට් මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්, 280 තරියන්කුලම පොදු සුසාන භූමියේ ඉදි කරනු ලබන සොහෙන් ගෙය සඳහා තාක්ෂණ නිළධාරී මහතාගේ නිර්දේශය මත අවශ්‍ය ඇස්බැස්ටෝ ශීට් මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඇස්බැස්ටෝස් ශීට් සඳහා ඉදිරිපත් වී ඇති මිල ගණන් වලට සාපේක්ෂව අනුරාධපුර ගොඩනැගිළි ද්‍රව්‍ය සංස්ථාවේ පවතින මිල අවම බැවින් අවශ්‍ය ඇස්බැස්ටෝ ශීට් රජයේ ආයතනයක් වන එම ආයතනයෙන් එකක් රු 2,330.00 බැගින් සම්පූර්ණ වටිනාකම රු 37,280.00 මිල දී ගැනීමට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**V. සනීපාරක්ෂක වැසිකිළි පද්ධති සඳහා අවශ්‍ය කොමඩ් මිල දී ගැනීම.**

බල ප්‍රදේශයේ ආබාදිත පුද්ගලයින් සඳහා සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් ලබා දීම වෙනුවෙන් අවශ්‍ය කොමඩ් මිල දී ගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් සඳහා අවශ්‍ය කොමඩ් සඳහා ඉදිරිපත් වී ඇති මිල ගණන් වලට සාපේක්ෂව අනුරාධපුර ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ පවතින මිල අවම බැවින් අවශ්‍ය සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් සඳහා අවශ්‍ය කොමඩ් 03 ක් රජයේ ආයතනයක් වන එම ආයතනයෙන් එකක් රු 21,850 කට සම්පූර්ණ වටිනාකම 65,550.00 කට මිල දී ගැනීමට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**VI. ප්‍රාදේශීය සභා උප කාර්යාලය (විදාතා මධ්‍යස්ථානය) අළුත්වැඩියා කිරීම.**

ප්‍රාදේශීය සභාවට අයත් නාච්චාදූව උප කාර්යාලය (විදාතා මධ්‍යස්ථානය) අළුත්වැඩියා කිරීමට අදාල රු 842,788.59 ක ඇස්තමේන්තුව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව ප්‍රකාරව උප කාර්යාලය සභා අරමුදලින් ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධානයක් හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**VII. ප්‍රාදේශිය සභා කාර්යාලයට අවශ්‍ය ටෝනර් මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභා කාර්යාලයට අවශ්‍ය ටෝනර් මල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් ටෝනර් සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති මෛත්‍රිපාල සේනානායක මාවත, අනුරාධපුර ලිපිනයේ පිහිටි වයි ෆයි සෝන් කම්පියුටර් ටෙච්නොලජීස් (පුද්) සමාගම වෙතින් සම්පූර්ණ වටිනාකම රු 62,000.00 කට කාර්යාලයට අවශ්‍ය ටෝනර් මිල දී ගැනීමට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිනිය 2021.05.07 වන දින මුදල් කමිටුව මගින් ලබා ගත් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විරෝධතා පවතින්නේ ද යන්න විමසන ලදී. ඒ අනුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021 මැයි මස මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**13. 2021 ජුනි මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021 ජුනි මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

පැය ගණන

| | | |
|---|---|---|
| 01. එච්.එම්.එස්.ඩී චන්ද්‍රසිරි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 02. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 40 |
| 03. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 04. එස්.පී.එම් පුෂ්පකුමාරි මිය | (පුස්තකාල සහයක) | 40 |
| 05. කේ.ජී.ජී.ඩී ගමගේ මිය | (පුස්තකාල සහයක) | 40 |
| 06. ඩබ් තිලකරත්න මයා | (කා.කා.ස) | 40 |
| 07. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 40 |
| 08. ඒ.ඒ පියතිස්ස මයා | (මුරකරු) | 75 |
| 09. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 75 |
| 10. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 11. ජේ.එම්.ජේ.ආර්.කේ ජයසුන්දර | (විදුලි කාර්මික) | 40 |
| 12. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 13. ඩී.එම් ගුණරත්න බංඩා මයා | (කා.කා සහයක) | 75 |
| 14. සුභාෂ් ගයාෂාන්   මයා | (අනියම් රියදුරු) | 40 |
| 15. පියල් බුද්ධික මයා | (අනියම් මාර්ග කම්කරු) | 40 |
| 16. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 75 |

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා 2021 ජුනි මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සම්බන්ධව යම් විරෝධතාවයන් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2021 ජුනි මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**14. පෙර සුදානම් කාර්යය සාධන අත්තිකාරම් අරමුදල යෙදවීමටු සුදුසු ව්‍යාපෘති අනුමත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සංවර්ධන සහයවීම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන සඳහා සපයන ප්‍රාරම්භක කාර්ය සාධනය සඳහා මූල්‍ය අත්තිකාරමක් වශයෙන් ඩොලර් 7000 ක මුදලක් පළාත් පාලන ආයතන මට්ටමින් ලබා දීමට කටයුතු සූදානම් කර ඇති හෙයින් ඊට අදාලව මෙම ප්‍රාදේශිය සභාව තුල ක්‍රියාත්මක කල යුතු යෝජනා සභාවට ඉදිරිපත් කරමින් එම යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

*පියවර 1 (Stage 1) යටතේ ප්‍රාරම්භක කාර්ය සාධනය සඳහා මූල්‍ය අත්තිකාරම (PPTA) සඳහා තෝරාගත වැඩසටහන් සාරාංශය*

| ක්ෂේත්‍ර | වර්ග ( විෂය පථයන්) | යොමු අංකය සහිතව තෝරාගත් ක්‍රියාකාරකම (ඇමුණුමේ B තීරුව බලන්න ) | තෝරාගත් ක්‍රියාකාරකමේ නිමැවුම් (output) දර්ශක වල ඉලක්ක (ඇමුණුමේ D තීරුව බලන්න ) | අවශ්‍ය මුදල - රුපියල් ( විස්තරාත්මක අයවැය පසුව ඉදිරිපත් කිරීම අවශ්‍යවේ. ) | අවසන් කරන දිනය |
|---|---|---|---|---|---|
| **ක්ෂේත්‍ර** 1: ප්‍රජාව සුරක්ශිතව තබාගැනීම | 1.1 1 කොවිඩ් පැතිරීම පාලනය කිරීම හෝ නැවැත්වීම | විෂබීජ නාශක දියර ඉසීම. | විෂබීජ නාසක දියර 5L **15 වරක්** **15Xරු. 3500** | 52 500.00 | 2021.06.10 |
| | | විෂබීජ නාශක උපකරණ මිළ දී ගැනීම. | අත් සේදීමේ පහසුකම් ඇතිකිරීම **සබන් කැට180X රු.50** අත් සේදීමට **දියර 3*10*200** | 16 200.00 | 2021.06.15 |
| | | සෞඛ්‍ය කම්කරු මහතුන් සඳහා ලබා දී ඇත. | ආරක්ෂිත ඇඳුම් කට්ටල ලබා ගැනීම. **බූට් හා ආරක්ෂිත ඇඳුම් කට්ටල 05*රු10 000** | 50 000.00 | 2021.06.10 |
| | | විෂබීජ නාශක ලබා ගැනීම | කාර්යාලයේ සියලුම නිලධාරීන් සඳහා (senitizer)සෙවකයින් **50කට විෂබීජ නාශක** දියර 4L මාස **12*5300** | 63 600.00 | 2021.06.10 |
| | | අත් සේදීමට අවශ්‍ය උපකරණ ලබා ගැනීම සහ ස්ථාන හඳුනා ගැනීම. | ප්‍රධාන කාර්යාලය ඇතුළු උප කාර්යාල සහ පුස්තකාල සඳහා **අත් සේදීම බේසම් රාමු සහිත sig 10ක් රු .10000 බැවින්** | 100 000.00 | 2021.06.10 |
| | | **අත් ආවරණ ලබා ගැනීම** | **පරිසරය පිරිසිදු කිරීමේ දී විෂබීජ වලින් ආරක්ෂා වීම සඳහා අත් ආවරණ කට්ටල 50 රු.300** | 15 000.00 | 2021.06.10 |
| | | කාර්යලයේ සහ නිලධාරීන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා | මුහුණු ආවරණ ලබා ගැනීම. **(Face guard) 100* රු250** | 25 000.00 | 2021.06.15 |
| | | කාර්යලයේ සහ නිලධාරීන්ගේ | මුහුණු ආවරණ ලබා ගැනීම. (Face masks) | 60 000.00 | 2021.06.15 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | සෞඛ්‍ය ආරක්ෂාව සඳහා | **පෙට්ටි මසකට 20 පෙට්ටි 100*රු.600** | | |
| | 1.2 රෝග වැලැක්වීමේ සේවාවන් සඳහා පහසුකම් සැපයීම | නාම පුවරු සැකසීම | ප්‍රධාන නගරය සහ උප නගර වල දැනුවත් කිරීමේ නාම පුවරු සැකසීම<br><br>**වර්ග අඩි 15 දැන්වීම් පුවරු 15ක් කොට්ඨාස 11 කට රු 1300**<br>**ශබ්ධ විකාශණ යන්ත්‍ර ප්‍රචාරණය 10 වතාවක්** | 30,000.00 | 2021.06.25 |
| | | 1.2a අත්‍යාවශ්‍ය සෞඛ්‍ය සහ රෝග නිවාරනය සේවා සඳහා අවදානමට ලක්වූ පවුල් සඳහා ප්‍රවේශය ආරක්ෂා කිරීම. | 1.2a.2 ආයුර්වේදික සායන හරහා ප්‍රතිශක්තිය වැඩිදියුණු කිරීමේ විකල්ප ඖෂධ ලබාදීමට<br>**සුවධරනි පෙකට් 200ක්X රු .250** | 50 000.00 | 2021.06.20 |
| | | 1.2b නිරෝධාන ස්ථානවල ඝන අපද්‍රව්‍ය පරිහරණය කිරීමේ මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක කිරීමට ආධාර (පළාත් සභා සහ පාලන කටයුතු අමාත්‍යංශය සහ සෞඛ්‍ය අමාත්‍යංශයේ මාර්ගෝපදේශයන් අනුව) | 1.2b.1 කුණු එකතුකිරීමේ වාහන වෙනස්කිරීමට (Modify)කසල ට්‍රේලරය සැකසීම.<br>1.2b.2 කුණු එකතු කිරීමේ සේවකයන්ට පෞද්ගලික ආරක්ෂිත උපකරණ (PPEs) සැපයීමට (ආරක්ෂිත ඇඳුම් කට්ටල)<br>1.2b.3 නිරෝධායන මධ්‍යස්ථාන සහ නිවෙස්වල කසළ එකතුකිරීමට<br>1.2b.4 නියමිත ක්‍රමවේද අනුව මුහුණු ආවරණ එකතුකිරීමට සහ බැහැරකිරීමට. | 175 000.00<br><br>25 000.00 | 2021.07.01 |
| | 1.3 ප්‍රථමයෙන් ප්‍රතිචාදක්ව න්නන්ගේ (පළාත්පාල න ආයතනයේඉ දිරිපෙළ සේවකය න්ගේ ) කුසලතාවය න් ප්‍රවර්ධනය | ඉදිරිපෙළ සේවකයින්ට ප්‍රතිචාර දැක්වීම. | කාර්යාලය ආරක්ෂිත ආවරණ සහිතව සකස් කිරීම<br>**(vip hat ) 4ක් රු.25000** | 100,000 .00 | 2021.07.10 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 1.3a කොවිඩ් 19 සහ සෞඛ්‍යාරක්ෂිත නීති රීති සම්බන්ධව පළාත් පාලන ආයතනයේ ඉදිරිපෙළ සේවකයන්ට (ප්‍රථමයෙන් ප්‍රතිචාදක්වන්න න්ගේ) ප්‍රථමයෙන් පුහුණුවක් ලබාදීම | 1.3a.1 කොවිඩ් 19 සහ සෞඛ්‍යාරක්ෂිත නීති රීති සම්බන්ධව පළාත් පාලන ආයතනයේ සේවකයන්ට (ප්‍රථමයෙන් ප්‍රතිචාදක්වන්නන්) ප්‍රථමයෙන් පුහුණුවක් ලබාදීම (සනීපාරක්ෂක සේවකයන්, සෞඛ්‍ය කම්කරුවන්, පෙරටු කාර්යල කාර්යයමණ්ඩල,ක්ෂේත්‍ර නිලධාරීන් අදී...) . | 20 000.00 | 2021.06.25 |
| **ක්ෂේත්‍ර** 2: අවධානමට ලක්වූවන් සහ දුප්පතුන්ගේ ආරක්ෂාව | 2.4 දුප්පතුන් සඳහා සේවා සැපයීම ප්‍රවර්ධනය කිරීම | අඩු ආදායම් පවුල් සඳහා සේවා සැපයීම | ජල පහසුකම් නොමිලේ සැපයීම. සනීපාරක්ෂක පහසුකම් නොමිලේ සැපයීම. **10 වරක්** | 117 700.00 | 2021.07.05 |
| **ක්ෂේත්‍ර** 3: ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය (LED)) | 3.1 ප්‍රාදේශීය සංවර්ධනය (LED) සඳහා යටිතල පහසුකම් | මාතෘ සහ ළමාසුරකුම් සායන වල අවශ්‍යතා හඳුනා ගැනීම. ආසන පහසුකම් වැඩි දියුණු කිරීම කාන්තාවන් සඳහා වෙනම ම වැසිකිළි පහසුකම් සැපයීම මව්කිරි දීමේ කාමර ඉදිකිරීම දිවා සුරකුම් පහසුකම් | මාර්තෘ සායන/සෞඛ්‍ය හා සායන මධ්‍යස්ථාන සඳහා පුටු ලබා දීම. **පුටු 150ක් රු1666.66** **වැසිකිළි 10ක් රු25000** | 500 000.00 | 2021.07.10 |

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කර ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යනන් විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් පෙර සූදානම් කාර්යය සාධන අත්තිකාරම් අරමුදල යෙදවීම සඳහා ඉදිරිපත් කල යෝජනාව ක්‍රියාත්මක කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**15.** **ගිවිසුම් කාලය අවසන් ප්‍රාදේශීය සභා භූමියේ පිහිටි කඩ කාමර ටෙන්ඩර් කිරීම**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> නැගෙනහිර නුවරගම් පළාත් ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රාදේශීය සභා භූමියේ පිහිටි කඩ කාමර අංක 02,03,04,05, හි ගිවිසුම් කාලය 2021.06.15 වන දිනෙන් අවසන් වන බැවින් එම කඩ කාමර 2021 වර්ෂයේ ඉදිරි මාස 06 සඳහා අවම ලංසුව රු 16,250 යටතේ ප්‍රාදේශීය ලංසුපත් කැඳවීම යටතේ ටෙන්ඩර් කර සුදුසු පුද්ගලයින් වෙත ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා</u> ගරු සභාපතිතුමා විසින් ප්‍රාදේශීය සභා භූමියේ පිහිටි කඩ කාමර ප්‍රාදේශීය ලංසුපත් කැඳවීම යටතේ ටෙන්ඩර් කර ඉදිරි මාස 06 සඳහා ලබා දීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රාදේශීය සභා භූමියේ පිහිටි කඩ කාමර අංක 02,03,04,05, හි ගිවිසුම් කාලය 2021.06.15 වන දිනෙන් අවසන් වන බැවින් එම කඩ කාමර 2021 වර්ෂයේ ඉදිරි මාස 06 සඳහා අවම ලංසුව රු 16,250 යටතේ ප්‍රාදේශීය ලංසුපත් කැඳවීම මගින් ටෙන්ඩර් කර සුදුසු පුද්ගලයින් වෙත ලබා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** **බල ප්‍රදේශය තුල මාර්ග ලෙස, හඳුනාගත් මාර්ග ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදිස මැතිතුමා</u> ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්, මාර්ග ලෙස හඳුන්ගත් මාර්ග ලැයිස්තුව මහ සභාවට ඉදිරිපත් කරමින් ඉදිරිපත් කල මාර්ග ලැයිස්තුව ගැසට් පත්‍රයේ පල කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිනිය ඉදිරිපත් කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කර ඇති මාර්ග ලැයිස්තුව ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා ගෙන ආ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විම්සූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් බල ප්‍රදේශයට අයත් මාර්ග ගැසට් පත්‍රයේ පල කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** **ප්‍රාදේශීය සභා පනතේ 59 වගන්තිය ප්‍රකාරව බලය පැවරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ප්‍රාදේශීය සභා පනතේ 59 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවක පාලනය යටතේ යම් මංමාවතක් මත වූ බාධකයක් හෝ ප්‍රසර්පණයක් වහාම ඉවත් කරන ලෙස හෝ නතර කරන ලෙස ඒ බාධකය සිදු කල හෝ ප්‍රසර්පණය කල යම් තැනැත්තෙකු වෙත ඒ ප්‍රාදේශීය සභාව විසින් ත්ත කාර්යය සඳහා ඒ ප්‍රාදේශීය සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තෙකුගේ මාර්ගයෙන් වාචිකව හෝ ලියවිල්ලකින් වූ දැන්වීමකින් නියමයක් කිරීම නීත්‍යානුකූල වන බවට සඳහන් වන බැවින් එම බලය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙත පැවරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා</u> අදාල බලය පැවරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රාදේශීය සභා පනතේ 59 වගන්තිය ප්‍රකාරව බලය පැවරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** **ප්‍රාදේශීය සභාවට අයත් බදු දී ඇති ස්ථාන සඳහා සංවරණ සීමා සැළකිල්ලට ගෙන හිඟ දඩ පොලිය අය කිරීම සම්පූර්ණයෙන් නතර කිරීම සඳහා වූ යෝජනාව**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා පවතින අයහපත් සෞඛ්‍ය තත්වය මත බල ප්‍රදේශයේ ව්‍යාපාරිකයන් වෙත මුහුන දීමට සිදු වූ ගැටළු හමුවේ ප්‍රාදේශීය සභාවට අයත් බදු දී ඇති ස්ථාන සඳහා සංවරණ සීමා සැළකිල්ලට ගෙන මැයි මස සිට මාස 06 ක කාලයක් හිඟ දඩ පොලිය අය කිරීම සම්පූර්ණයෙන් නතර කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ .ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රාදේශීය සභාවට අයත් බදු දී ඇති ස්ථාන සඳහා සංවරණ සීමා සැළකිල්ලට ගෙන මැයි මස සිට මාස 06 ක කාලයක් හිඟ දඩ පොලිය අය කිරීම සම්පූර්ණයෙන් නතර කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09. 2020 වර්ෂයේ සහන වාරිකය 2021 වර්ෂය වෙනුවෙන් හිලව් කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2020 වර්ෂය වෙනුවෙන් නෙළුබැව එළ ගව මස් කඩය බදු පදනමින් ලබා ගත් එම්.එෆ්.එම් මුනව්වර් යන අය එම වර්ෂයට අදාලව බදු මුදල් වශයෙන් රු 136,000 ක් ගෙවා ඇති මුත් වර්ෂයට අදාල බදු සහන ලබා දීමෙන් පසු එම බදුකරු විසින් ගෙවිය යුතු වන්නේ 126,000 බදු මුදලක්ය. එබැවින් මෙම අය විසින් එම වර්ෂය සඳහා වැඩිපුර රු 10,00 මුදලක් සභාව වෙත ගෙවා ඇති බැවින් ඔහු විසින් වැඩිපුර ගෙවා ඇති මුදල 2021 වර්ෂය වෙනුවෙන් නෙළුබැව එළ ගව මස් කඩයේ වාරික මුදල් වලින් අඩු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2020 වර්ෂයේ සහන වාරිකය 2021 වර්ෂය වෙනුවෙන් හිලව් කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10. කොරෝනා වසංගතය වැළඳෙන සභා සේවකයන් වෙත හා ගරු සභාකයින් වෙත රු 5000 ක සහන මල්ලක් ලබා දීම.**

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ප්‍රාදේශීය සභාවේ සේවය කරනු ලබන ස්ථිර හා අනියම් කාර්යය මණ්ඩලයේ හෝ ගරු සභිකවරයෙකු හෝ කොරෝනා වසංගතය වැළඳීම හේතු කොට ගෙන පත්වන අපහසුතා වෙනුවෙන් රු 5,000 ක ආහාර ද්‍රව්‍ය ඇතුලත් සහන මල්ලක් ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා පවතින තත්වය සැළකිල්ලට ගෙන එකවර කිහිපදෙනෙකු කොරෝනා වැළඳි රෝගාතුර වුවහොත් ඒ වෙනුවෙන් පෞද්ගලිකව උපකාර කිරීමේ හැකියාවක් නොමැති බැවින් සභා කාර්යාලයේ සේවකයින් හෝ ගරු සභිකවරයෙකු වෙත කොරෝනා රෝගය වැළඳුනහොත් ඒ වෙනුවෙන් රු 5000 ක් වටිනා ආහාර ඇතුලත් සහන මල්ලක් ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් කොරෝනා රෝගය වැළදෙන කාර්යාලයේ සේවකයින් හෝ ගරු සභිකවරයෙකු වෙත රු 500 ක ආහාර ඇතුලත් සහන මල්ල ලබා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2021 මැයි මස 07 වන දින මුදල් කමිටු වාර්ථාව

**සභා ගත කරන ලදී.**

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2021 අප්‍රේල් මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> වියදම් වාර්ථාවේ පරිපාලන වියදම්, සේවක වැටුප් , මන්ත්‍රී දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා විරුද්ධ වන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මාසික ආදායම් වාර්තාව තුල මේ දක්වා එකතු කල යුතු ආදායමේ ප්‍රතිශතයක් ලෙස දක්වා ඇති අගය වැරදි බව සඳහන් කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> තමන් මීට ඉහතදී හියුම් පයිප්ප ස්ථානගත කිරීම සම්බන්ධව විස්තර වාර්තාවක් ලබා දෙන ලෙසට ඉල්ලීම් කලත් එය ලබා දීමට කටයුතු නොකල බවත්. අයවැය සභා සම්මත කිරීම සිදු කලා වුවත්, එහි යම් යම් වැරදි හා අඩුපාඩු පැවති බැවින් එය නැවත නිවැරදි කර ලබා දෙන බවට ප්‍රකාශ කලත් එය මෙතෙක් නිවැරදි නොකල බවත්, සඳහන් කරමින් මුළු රටම වෙලාගෙන ඇති කොරෝනා වසංගත තත්වය හමුවේ මිනිසුන් රෝගීන් වනවා සේම මරණ ප්‍රතිශතය හා ආබාධිත සංඛ්‍යාව දිනෙන් දින ඉහල යන බවත්, එසේ තිබියදී පළාත් පාලන ආයතනයක් ලෙස බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් නොව සභා කාර්යාලයේ සේවය කරන සේවකයෙකු වෙත කොරෝනා රෝගය වැළඳී තිබියදී ඔවුන් වෙනුවෙන් ලබා ගත් ක්‍රියාමාර්ග මොනවාද යන්නත්, 1987 ප්‍රාදේශීය සභා පනත අනුව අදාල පළාත් පාලන ආයතනය සඳහා ඇඳිරිනීතිය පැනවීමේ පවා බලය පවතින බවත්, එසේ තිබියදී බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් විශාල වැඩ පිළිවෙලක් දියත් නොකිරීම සම්බන්ධයෙන් කණගාටු වන බවත්, සඳහන් කරමින් ඊට අදාල පියවර කඩිනමින් ලබා ගන්නා ලෙසට ප්‍රකාශ කරන ලදී.

තවද මේ වන තෙක් අනුරාධපුර දිස්ත්‍රික්කය තුල කොරෝනා මර්ධන එන්නත ලබා දීමේ හැකියාව හිමි වී නැති බවත්, එය ඉතාම සෝචනීය තත්වයක් බවත්, ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාද වගකීම දැරිය යුතු බවත්, කොවිඩ් නොමැති සාමාජයක් ඉදි කිරීම සඳහා වන වැඩ පිළවෙල කඩිනම් කරන ලෙසත්, දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද නිරෝධායනය වන පිරිස් බල ප්‍රදේශය තුල සිටින බැවින් සිදු කරනු ලබන අනෙක් කාර්යයන් පසෙකලා එම ජනතාව වෙනුවෙන් සුදුසු වැඩපිළිවෙලක් සකස් කරන ලෙසත් සඳහන් කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා කටුගම්පල මාර්ගයක් සකස් කිරීම සම්බන්ධයෙන් ලිපියක් දෙවන වතාවටත්, තමා වෙත යොමු කර ඇති බවත්, එය ගියවර විමසීම සිදු කලත් ඉදිරිපත් නොවූ බවත්, එම ලිපිය සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර කුමක්ද යන්න විමසන ලද අතර එම ලිපියේ පිටපතක් නැවත සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා දැනට බල ප්‍රදේශයේ නිරෝධායනය කරනු ලබන පුද්ගලයින් සඳහා ආහාර ද්‍රව්‍ය මල්ලක් ලබා දීමේ වැඩපිළිවෙලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක වන බවත්, මෙවායෙහි ගැටළු නොපවතිනවාම නොවන බවත්, එහිදී තමන් මැදිහත් වූ අවස්ථා ගණනාවක් පවතින බවත්, දැනට සභාව මැදිහත් වී ප්‍රචාරක දැන්වීම් සිදු කරමින් පවතින බවත්, ඉදිරියේදී යම් යම් ක්‍රියාමාර්ගයන් ගැනීමට අපේක්ෂාවෙන් සිටින බැවින් ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කරන බවත්, සඳහන් කරන ලදී.

අනතුරුව බල ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ දන්නා හා නොදන්නා කරුණ සම්බන්ධයෙන් විවිධ අදහස් සියළු දෙනාම එක්වී යහපත් චේතනාවෙන් යුතුව ඉදිරිපත් කල  ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තුතිය ප්‍රකාශ කරමින් 2021.05.21 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 12.30 ට අවසන් කරන ලද අතර එළබෙන මහ සභාව 2021.06.22 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

| | |
|---|---|
| ..................................... | ............................................ |
| බී.එච් ප්‍රදීල් නිශාන්ත | එස්.බී කුමාරදාස මැතිතුමා |
| ලේකම්, | සභාපති , |
| නැ.නු.ප ප්‍රාදේශීය සභාව, | නැ.නු.ප්‍රාදේශීය සභාව, |
| විජයපුර. | විජයපුර. |